**වවුනියාව (දකුණ) සිංහල ප්‍රාදේශීය සභාව**
**වවුනියාව දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩණ වාර්තාව 2019 ජුනි 26 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුලි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්ථාවේ තත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වවුනියාව දකුණු සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | උපචිත පදනම මත සමාලෝචිත වර්ෂයේ ගිණුම් පිළියෙල කර ඇත. |

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ප්‍රාදේශීය සභාව සතු ඉඩම් අක්කර 150 ක කඩ කාමර 13 ක හා වාහන 03 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | සියළු වත්කම් ගිණුම් ගත කළ යුතු වේ. | අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලැබීම අනුව වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ආදායම් වියදම් ගිණුමේ වැඩසටහන 03 යටතේ දක්වා තිබුණු රු. 13,600,696 ක ප්‍රාග්ධන ලැබීම් තුළ පෙර වර්ෂවල හිඟ මුද්දර ගාස්තු හිලව් කිරීමට පළාත් සභාවෙන් ලද රු. 607,392 ක මුදලක් ද ඇතුළත් කර තිබුණි. | වර්ෂයට ආදාළ ආදායම් පමණක් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | ඉදිරියේදී අවශ්‍ය නිවැරදි කිරීම් කරනු ලැබේ. |
| (iii) | සංස්කෘතික මධ්‍යස්ථානයේ කුලී ගිවිසුම අනුව සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වන මාස 03 ක් සඳහා කුලී ආදායම රු. 456,499 ක් වුවද එය රු. 771,176 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | ඉදිරියේදී අවශ්‍ය නිවැරදි කිරීම් කරනු ලැබේ. |
| (iv) | සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොළී රු. 185,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල සියළු අදායම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | 2020 වර්ෂයේ ස්ථාවර තැන්පතුව කල්පිරෙන නිසා එම වර්ෂයේ ගිණුම් වල අනාවරණය කිරීමට කටයුතු කරමි. |

**(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුද්දර ගාස්තු රු. 974,750 ක් වූ අතර එම වටිනාකම තුළ වසර 01 සිට වසර 03 ක් දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ රු. 694,750 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ආදායම් සියල්ල අය කර ගැනීමට ලිඛිතව දන්වා ඇත. ඉදිරියේදී අය කරනු ලැබේ. |
| (ii) 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වාහන කුලී ආදායම රු. 385,570 ක් වූ අතර ඉන් රු. 257,022 ක් වසර 01 සිට 07 දක්වා කාලයක සිට හිඟව පැවතුණි. | ලැබිය යුතු ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරන අතර මේ වන විට අවශ්‍ය දැනුවත් කිරීම් ලිඛිතව කර ඇත. ඉදිරියේදී අය කරනු ලැබේ. |
| (iii) 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 15,000 ක අත්තිකාරම් මුදල වසර 02 ට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අය කිරීමට ලිඛිතව ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇති අතර ඉදිරියේදී අය කරනු ලැබේ. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| ගිණුම් විෂය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අදාල සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු. 97,993,493 ක් වූ ගිණුම් විෂයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූලාශ්‍ර ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර මිනුම් කිරීමෙන් පසු අයිතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් මිලදී ගත් භාණ්ඩ සභාවේ මන්ත්‍රීවරුන් විසින් ප්‍රතිලාභීන් වෙත බෙදා දී ඇත. බෙදා දීමේදී ගත් ඡායා රූප ඉදිරිපත් කරමි. ලැබිය යුතු ශේෂ ඉදිරියේදී නිවැරදි කරමි. ධාවන සටහන් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත: | | | |
| - 127 වගන්තිය | සුසාන භූමි සහ මිනී පිටි ආඥාපනතේ 3 වන වගන්තියේ කාර්යය සඳහා සභාව නිසි බලධරයා ලෙස කටයුතු කර නොතිබුණි. | ආඥාපනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය: | | | |
| - 59 රීතිය | සෑම වර්ෂයකම ආරම්භයේදී කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව අදාල සමීක්ෂණ ලැයිස්තු නිවැරදිව හා කාලීනව පිළියෙල කළ යුතු වේ. | ආදායම් වලින් සියයට 90 ක් පමණ එක් රැස් කර ඇති නමුත් අදාල සමීක්ෂණ ලැයිස්තු සකස් කර නැත. ඉදිරියේදී නිවැරදි කරමි. |
| - 68 රීතිය | සභා බල ප්‍රදේශය තුළ සංවර්ධනය නොකරන ලද ඉඩම් හඳුනාගෙන බද්දක් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව අදාල බදු අය කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කර බදු අය කිරීමට කටයුතු කරනු ලැබේ. |
| - 180 රීතිය | ඇප තැන්පත් කළ යුතු තනතුරු දරන නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි. | රීති ප්‍රකාරව අදාල නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් ඉතා ඉක්මනින් අවශ්‍ය කටයුතු සිදු කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| - 191 රීතිය | සභා රැස්වීමේ සටහන් සනාථ කරනු ලැබූ පසු පිටපතක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව සභාව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ ඉදිරි මාස වල වාර්තා පිටපත් මාසිකව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය: | | | |
| - මුදල් රෙගුලාසි 570 | සෑම අර්ධ වර්ෂයක් අවසානයේදීම ඉකුත් වූ සියළුම තැන්පතු පිළිබඳව ලැයිස්තු විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මුදල් රෙගුලාසි අනුව විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු. 4,544,628 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,296,770 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| (ii) | කුලී | 1,500,000 | 1,420,875 | 1,420,875 | 187,197 | 1,606,000 | 910,510 | 910,510 | 781,560 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,610,000 | 1,149,200 | 1,149,200 | - | 1,090,000 | 1,357,423 | 1,357,423 | - |
| (iv) | වෙනත් ආදායම් | 4,176,000 | 5,927,759 | 5,927,759 | 2,820,619 | 3,738,000 | 5,603,452 | 5,603,452 | 2,963,562 |
| | එකතුව | **72,86,000** | 8,497,834 | 8,497,834 | 3,007,816 | 6,434,000 | 7,871,385 | 7,871,385 | 3,745,122 |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වෙළඳ බලපත්‍ර ආදායම, ඉකුත් වර්ෂයේදී ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 125 ක් වුවත් සමාලෝචිත වර්ෂයේදී එකී ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 71 ක් දක්වා අඩු වී තිබුණි. | ආදායමේ වර්ධනය කර අඛණ්ඩව පවත්වා ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතු වේ. | උතුරු පළාත් ආණ්ඩුකාරවරයා විසින් ගල්කොරි වෙළඳ බලපත්‍ර ගාස්තු රු. 3,000 දක්වා අඩු කිරීම නිසා ආදායම් අඩු වී ඇත. |

**2.2.3 බලපත්‍ර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 ජුනි 20 දින මාමඩුව ප්‍රදේශයේ ස්ථාපිත කර තිබූ දුරකථන කුළුණ වෙනුවෙන් අයවිය යුතු රු. 210,000 ක ස්ථාපිත ගාස්තුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාපිත කිරීමේ ගාස්තු නිසි පරිදි අය කර ගැනීමට කටයුතු කල යුතුය. | ඉඩමේ අයිතිය ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සතු නිසා ස්ථාපිත කිරීමේ ගාස්තු ගෙවීම එම ආයතනයේ නීති අංශය විසින් ප්‍රතික්ෂේප කර ඇත. |

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උතුරු පළාත් සභාව වෙතින් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 3,013,874 ක් හා මුද්දර ගාස්තු රු. 994,750 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් කාලීනව හා අප්‍රමාදීව අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | ඉදිරියේදී කාලීනව අය කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තවයයන් ඉටු කිරීම පිළිබඳව සිදුකරන ලද පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණු නමුත් ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | උචිත කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ඒ අනුව කටයුතු කරනු ලැබේ. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා අරමුදලින් වෙන් කළ රු. 1,294,866 ක ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබුණු ව්‍යාපෘති 03 ක් සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ව්‍යාපෘති සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ඇ) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා අරමුදලේ වෙන්කරන ලද රු. 300,000 ක ප්‍රතිපාදනවලින් අලුත්වැඩියා ආරම්භ කර තිබුණු පෙරියඋළුක්කුලම මාර්ගය 2018 දෙසැම්බර් 31 දිනට නිම කළ යුතු වුවත් එදිනට භෞතික ප්‍රගතිය සියයට 50 ක මට්ටමක පැවතුණි. | අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා ගැනීමට කටයුතු කල යුතු වේ. | කොන්ත්‍රාත් වැඩ හැකි ඉක්මනින් නිම කර ප්‍රගතිය වාර්තා කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුළ ඝන අපද්‍රව්‍ය එකතු කිරීම, වෙන්කිරීම හා ප්‍රතිචක්‍රීකරණය කිරීම සම්බන්ධයෙන් සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමු විය යුතු වේ. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභාව සතු ලංකා බැංකුවේ ජංගම ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු. 4,649,426 ක අතිරික්ත මුදල් ශේෂයෙන් යම් කොටසක් ඵලදායී ආයෝජන මාර්ගයක යෙදවීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | අරමුදල් ඵලදායී ලෙස යෙදවීමට කළමනාකරණයේ අවධානය යොමු විය යුතු වේ. | පිළිතුරු ලබා දී නැත. |
| (ආ) සභාව සතුව වාහන සහ යන්ත්‍ර සූත්‍ර 30 ක් තිබුණද ඒ සඳහා එක් රියදුරෙකු පමණක් අනුයුක්තව තිබුණි. | වාහන හා යන්ත්‍ර සූත්‍ර කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් සැලසුම් කර ක්‍රියාත්මක කල යුතු වේ. | පවතින තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවේ පැවති තනතුරු පුරප්පාඩු 11 ක් සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. | තනතුරු වල පවතින පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කල යුතු වේ. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් ලිඛිතව දැනුවත් කර පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඉල්ලීම් කර ඇත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශ ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත්කොට වරිපනම් බදු නියම කිරීමට හා අය කිරීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | දැනට දියුණු කළ ප්‍රදේශ හඳුනා ගෙන නැත. හඳුනා ගතහොත් බදු අය කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ධාවනයෙන් ඉවත් කළ වාහන 04 ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන අලුත්වැඩියා කර ඵලදායීව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී මෙම වාහන අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරනු ලැබේ. |

### 3.5.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කැබලි 68 කින් යුත් අක්කර 150 ක ඉඩම් නිරවුල් කර සභාවට පවරා ගැනීමට හා වාහන 28 ක අයිතිය පවරා ගැනීමට 2019 අප්‍රේල් 26 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | වත්කම් වල නිරවුල් අයිතිය සභාව වෙත ලබා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී අයිතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |

### 3.5.3 නිෂ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව සතු වාහන 10 ක් මාස 09 සිට වසර 07 දක්වා කාලයක් නිෂ්කාර්යව පැවතුනි. | වත්කම් නිෂ්කාර්යව නොපැවැත්වීමටත් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමටත් කටයුතු කළ යුතු වේ. | අලුත්වැඩියා කර ආදායම් ඉපැයීමේ කාර්යයට යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 2013 වර්ෂයේදී රු. 2,298,816 ක් වැයකර ඉදිකර තිබුණු සතිපොළවල් 2 ක් 2019 අප්‍රේල් 26 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම සතිපොළවල් දෙක කිසිදු ගැණුම්කරුවෙකු ඉල්ලීම් නොකරන නිසා නිෂ්කාර්යව පවතී. |

### 3.5.4 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සභාවට අයත් වාහන 24 ක ඉන්ධන පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. | වාහනවල ඉන්ධන පරීක්ෂාවන් සිදු කළ යුතු වේ. | ඉදිරියේදී චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. |
| (ආ) | සභාව සතු අංක WPLG 8964 සහ අංක WPPF 3326 දරන කැබ් රථවල රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව රජයේ සියලුම වාහන සඳහා රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු කළ යුතු වේ. | රාජ්‍ය ලාංඡනය යෙදීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී රු. 912,683 ක ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙල කර ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කල යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 3.6.2 සැපයීම් හා සේවා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදය ප්‍රකාරව වෙළඳපල මිළ සැඳහුම් ක්‍රමයට අනුව අවස්ථා 04 කදී මිළදී ගෙන තිබුණු රු. 1,360,760 ක් වටිනා භාණ්ඩ සඳහා ලියාපදිංචි සැපයුම් කරුවන්ගෙන් මිළ ගණන් කැඳවා නොතිබුණි. | වෙළඳපල මිළ සැඳහුම් ක්‍රමයට අනුව මිළදී ගැනීම් සිදු කිරීමේදී ලියාපදිංචි සැපයුම් කරුවන්ගෙන් මිළ ගණන් කැඳවීමට කටයුතු කළ යුතු වේ. | දැනට සභාව සතුව ලියාපදිංචි සැපයුම් කරුවන් නොමැති අතර 2020 දී සැපයුම් කරුවන් ලියාපදිංචි කර ඒ අනුව ප්‍රසම්පාදයන් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන සැලසුමක් පිළියෙල කර අභ්‍යන්තර සිදුකර නොතිබුණි. | අභයන්තර විගණන සැලසුම් කාලීනව පිළියෙල කළ යුතු වේ. | ඉදිරියේදී අභ්‍යන්තර විගණන සැලසුම් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. |